ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව

උපාධි වැඩසටහන- 3වන මට්ටම 2020/2021

අවසාන පරීක්ෂණය

ළමා සංවර්ධනය - **EPU3530**

කාලය - පැය තුනයි. **(03)**

---

දිනය - **2023.01.07** වේලාව - පෙ.ව.**09.30** - ප.ව.**12.30** දක්වා

---

**1** වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, **2** වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට **(03)** ද පිළිතුරු සපයන්න.

## <u>I වන කොටස</u>

01. සංවර්ධනාත්මක සන්ධිස්ථාන යන්න උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

02. ළමා සංවර්ධනයට බලපාන පරිසර සාධක තුනක් **(03)** කෙටියෙන් පැහැදිලි කරන්න.

03. ප්‍රවේණියට එරෙහිව ඇති දැඩි කිරීම යන්න ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න.

04. ප්‍රාග් ප්‍රසව සංවර්ධනයට බලපාන සාධක පහක් **(05)**ලියන්න.

05. පියාජේ විසින් හඳුන්වා දෙන ලද ප්‍රජානන සංවර්ධනයේ පූර්ව සංකල්පන අවධියේ ගති ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න.

06. පෙර පාසල් සහ මුල් ප්‍රාථමික වසර තුළ සමාජීය හා චිත්තවේගීය සංවර්ධනයේ විශාල ප්‍රගතියක් දක්නට ලැබේ. ඔවුන්ගේ සමාජීය හා චිත්තවේගීය වර්ධනයට සහාය වීම සඳහා ගුරුවරුන්ට ක්‍රියාත්මක කළ හැකි පන්ති කාමර ක්‍රියාකාරකම් තුනක් **(03)** කෙටියෙන් සාකච්ඡා කරන්න.

07. සුදුසු නිර්වචනයක් ඇසුරෙන් *'පෞරුෂය'* යන්න පැහැදිලි කරන්න. ප්‍රාථමික වසර දරුවන්ගේ පෞරුෂ සංවර්ධනය සඳහා සුදුසු දෙමව්පියන් අනුගමනය කළයුතු ළමයින් හදාවඩා ගන්නා ක්‍රම තුනක් **(03)** සඳහන් කරන්න.

08. මනෝ විද්‍යාඥයින් විසින් ළමයින්ගේ සදාචාර සංවර්ධනයේ අවධි හතරක් සඳහන් කර ඇත. එම අවධි හතර **(04)** නම් කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. i. ළමයාගේ සංවර්ධන ක්ෂේත්‍ර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. ඉහත ඕනෑම ක්ෂේත්‍ර දෙකක (02) සංවර්ධනය සඳහා ගුරුවරයකුට කළ හැකි කාර්යය භාරයන් තුනක් (03) කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

10. i. මොළයේ සංවර්ධනය පිළිබඳ වත්මන් ස්නායු විද්‍යා පර්යේෂණ පිළිබඳ ඔබේ අවබෝධය පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. මොළයේ වර්ධනයට බලපාන පශ්චාත් ප්‍රසව සාධක සඳහන් කරන්න. කුඩා දරුවන්ගේ මොළයේ වර්ධනය සඳහා මෙම සාධක සහ වර්තමාන ස්නායු විද්‍යා පර්යේෂණ පිළිබඳ ඔබේ අවබෝධය භාවිත කළ හැකි ආකාරය කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

11. i. ප්‍රජානන සංවර්ධනය පිළිබඳ ව විගොට්ස්කි (Vygotsky) සහ පියාජේ (Piaget's) ඉදිරිපත් කළ අදහස් වෙන වෙන ම සාරාංශයක් ලෙස ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

ii. ප්‍රජානන සංවර්ධනය පිළිබඳ ව විගොට්ස්කි සහ පියාජේ ඉදිරිපත් කළ අදහස් ළමුන්ගේ ප්‍රජානන සංවර්ධනය සුසාධ්‍යකරණය සඳහා ගුරුවරයෙකු ලෙස ඔබ භාවිත කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. i. භාෂා සංවර්ධනය පිළිබඳ චර්යාවාදී මතය සහ උත්පත්තිවාදී මතය වෙන වෙන ම පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. සිසුන් තුළ භාෂා කුසලතාව ප්‍රගුණ කිරීම සඳහා ප්‍රාථමික පාසල් ගුරුවරයෙකුගේ භූමිකාව පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. i. ගුරුවරයෙකු ලෙස ඔබ ව්‍යාප්ත වන සුළු (අවවර්තීය) සංවර්ධනාත්මක දුබලතා (P.D.D) සහිත දරුවන් හඳුනා ගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. එම ගැටලුකාරී හැසිරීම් පාලනය කිරීමට සහය වීම සඳහා පෙරපාසල්/ප්‍රාථමික පාසල් ගුරුවරයෙකු වශයෙන් ක්‍රියාත්මක කරන ආකාරය පියවරෙන් පියවර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.